# පාස්කු ගී

## 360 කුරුසේ නැග අත් විහිදා

කුරුසේ නැග අත් විහිදා
මුළු ලෝ තුරුලට බදලා
සිටිනා දෙව් පුත් රඳුනේ
ඔබෙ පා සිඹිමින් වඳිමු

සිරසේ කිරුළේ මිණිසේ
බැබළේ බිඳු වැල් සිරිලේ
කුරුසේ සිටිනා දෙවිඳේ
ඔබෙ පා සිඹිමින් වඳිමු

ඔබ හා කුරුසේ නැගලා
ඔබෙ දෑසින් ලොව බලලා
ඔබසේ කරුණා පාලා
කුරුසේ හිඳිනා සමිඳේ

හිඳිනා ලෙස මා කැඳවා
කල්වාරිය මත නංවා
ඔබ හා මා හා සිටිමු
කුරුසේ හිඳිනා සමිඳේ